# 2022.02.08 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
10.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
11.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
13.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
14.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
15.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
16.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
24.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**රැස්වීම සඳහා සහභාගි නොවූ ගරු මන්ත්‍රීවරුන්**

01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
02.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා

05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 පෙබරවාරි මස මහා සභා රැස්වීමට සහභාගි වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගි වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

**I.2022.01.11 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.01.11 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.01.11 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

2022.01.11 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ගරු සභාපතිතුමණි,මේ වාර්තාවේ පුංචි කාරණයක් පිළිබව අදහස් දක්වන්නයි මා බලාපොරොත්තු වෙන්නේ.පසුගිය මහා සභාවට මට සහභාගී වෙන්න නොහැකි වුණා.එක් මන්ත්‍රීවරයෙක් සිදු කල ප්‍රකාශයක් පිළිබඳව තවත් මන්ත්‍රීවරයෙකුට ප්‍රකාශ කිරීමේ අයිතියක් නැති බව මම දන්නවා. 2022.01.11 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන 01 හි ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා 2021.12.14 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 43 හි එතුමාගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත වී නැති බවත්,එතුමාගේ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වාර්තාගත කරන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.ගරු සභාපතිතුමණි,මේ වාර්තාවේ මගේ නම සඳහන් කරලා රත්මල්ල කොට්ඨාසයේ පුද්ගලයෙකුගේ නම සඳහන් කරලා මම ප්‍රකාශයක් කලා තියලා තිබෙනවා.මම ඒක තරයේ ප්‍රතික්ෂේප කරනවා.මම ඉතා වගකීමෙන් කියනවා මෙතන දී අපේ ප්‍රකාශ රෙකෝඩ් කරන්න රෙකෝඩ් යන්ත්‍රයක් තිබෙනවා.ඒ නිසා එය පරිශීලනය කරලා මේ වාර්තාවට ඇතුලත් කලොත් සුදුසුයි කියලා මම විශේෂ ඉල්ලීමක් කරනවා.අපේ මේ ප්‍රාදේශීය සභාව පාර්ලිමේන්තුව නෙවෙයි.ප්‍රාදේශීය සභාවේ නෛතික බලය රඳා පවතින්නේ මේ වාර්තාව මතයි. තමන්ගේ කීර්ති නාමයට,අභිමානයට කැළලක් සිදු වුණා කියලා මේ වාර්තාවේ ප්‍රකාශ අරගෙන අවශ්‍ය නම් අධිකරණයට පවා යන්න පුළුවන්.ඒ නිසා නොකල ප්‍රකාශ මේ වාර්තාවට ඇතුලත් වීම පිළිබඳව කණගාටු වෙනවා.සාමාන්‍ය වාර්තාවක සඳහන් වෙන්නේ,සංක්ෂිප්ත කරලා තමයි මේ වාර්තාව ලියන්නේ.සිදු කරන සියලුම ප්‍රකාශ මේ වාර්තාවට ඇතුලත් කරනවා නම් අපේ සම්පූර්ණ ප්‍රකාශත් කිසිවක් අඩු නොවී මේ වාර්තාවට ඇතුලත් කරන්න.නමුත් එය නොවෙයි සිදු විය යුත්තේ.කතා කරන දේ හරය මේ වාර්තාවට ඇතුලත් වෙන්න ඕන.මම කියපු දෙයක් නෑ කියන්නේ නෑ. ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා අදහස් දැක්වීමේ දී මම පුංචි බාධාවක් සිදු කලා.එය එම වාර්තාවේත් තිබෙනවා.ප්‍රධාන පාරවල් තිබෙද්දී තුන් හතර දෙනෙක් ඉන්න,පෞද්ලික පාරවල් කපද්දී හා අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් කරද්දී ගරු සභාපතිතුමාටත් අපිටත් දෙමව්පියෝ සිහි කරලා බනියි කියලා.මම කිසිදු පුද්ගලයෙකුගේ නමක් සඳහන් කලේ නෑ.ඒ සම්බන්ධව මගේ කණගාටුව ප්‍රකාශ කරන

අතර,මම සිදු නොකල ප්‍රකාශ ඇතුලත් වීම සම්බන්ධව මගේ කණගාටුව ප්‍රකාශ කිරීම සහා වාර්තාවට ඇතුලත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,මමත් පසුගිය සභා වාරයට සම්බන්ධ වුණේ නෑ.මගේ නම් සඳහන් කරලා යම් යම් අසත්‍ය ප්‍රකාශ සිදු කර තිබෙනවා.මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලා තිබෙනවා විශේෂ යෝජනා යටතේ ඒ සම්බන්ධව කතා කරන්න දෙන්න කියලා.එහෙම නැතිනම් මේ අවස්ථාව ඔබතුමා ඒ සඳහා ලබා දෙනවාද?මට අසත්‍ය චෝදනා කිහිපයක් සිදු කරලා, මේ වාර්තාවේ ඒවා තිබෙනවා. මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලා තිබෙනවා වෙනත් කරුණු යටතේ හෝ විශේෂ යෝජනා යටතේ මට අවස්ථාවක් ලබා දෙන්න කියලා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා මේ වාර්තාවේ ඇතුලත් කාරණයක් සම්බන්ධව තමයි ඔබතුමා කියන්නේ.එහෙම නම් මේ වෙලාවේ ඉදිරිපත් කරන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,සංශෝධන යටතේ තමන් කතා කල දෙයක් සම්බන්ධවනේ සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නේ.මේ මම කතා කල දේවල් නෙවෙයි.පසුගිය මාසයේ අපේ අයිතීන් දිනා ගැනීම සඳහා අපි අරගලයක් කලා.ඒ පිළිබඳව අපි සතුටු වෙනවා.අපි නැති වෙලාවේ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් බොහෝම අසත්‍ය ආකාරයට ප්‍රකාශ කරලා තිබෙනවා.සභා වාර්තාවේ පිටු අංක 26,27,28 ඇතුළු පිටු කිහිපයකම ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම මේ ආකාරයට අපේ උපවාසය පිළිබඳව කතා කරලා තිබෙනවා. ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා කතා කරලා තිබෙනවා එතනට ගල් ප්‍රහාරයක් එල්ල වුණොත් බට කැඩෙයි කියලා.එහෙම ගල් ප්‍රහාර එහෙම ආවා නම් අපි බොහෝම සන්තෝෂයෙන් භාර ගන්නවා.එහෙම දෙයක් වුණේ නෑ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒ වගේ දේවල් ඇති වේවිද කියන්න බෑ ගරු මන්ත්‍රීතුමා.ඒ නිසා තමයි මම ගරු සභාවේ කීවේ මේ ස්ථානය උපවාස කරන්න සුදුසු ස්ථානයක් නෙවෙයි,අවශ්‍ය නම් මම එහා පැත්තේ පිට්ටනිය දෙන්නම් කියලා.මේ දේවල් වලට අලාභ හානි වුණොත් ඒ දේවල් වල වගකීම ඔබතුමා ඇතුළු උපවාස කල කණ්ඩායමට භාරගන්න ඕන කියලා මම කීවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

මට වෙනත් කරුණු යටතේ මේ සම්බන්ධව අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ඒක මම සලකා බලන්නම්.මොකද වෙනත් කරුණු යටතේ හදිසි යෝජනාවක් තමයි ඉදිරිපත් කරන්න පුළුවන්.ඔබතුමා ඉදිරිපත් කරන මේ කාරණයට අදාල සිදු වීම සිදුවෙලා දැන් මාසයකට ආසන්න කාලයක්.ඒ කාල සීමාව තුල දී ඔබතුමාට මේක න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්න කාලය තිබුණා.මේක හදිසි කාරණයක් නොවෙයි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,එහෙනම් මට විනාඩි දෙකක් දෙන්න.මේකේ සඳහන් වෙනවා අපිට වෙනත් විදියකින් විදුලිය ලබා දුන්නා කියලා.හැබැයි අපි ජෙනරේටරයක් මාර්ගයෙන් තමයි විදුලිය ලබා ගත්තේ.අවශ්‍ය කටයුතු අපි බොහෝම සංවිධානාත්මකව කරලා අවශ්‍ය කටයුතු කලා.මඩ ගහලා අපිට වට්ටවන්න බෑ.අපේ වැඩ කටයුතු අපි සාර්ථකව කරගෙන යනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,පසුගිය සභා වාරයේ මටත් සභාවට සහභාගී වෙන්න නොහැකි වුණා.නමුත් මම මේ අවස්ථාවේ කතා කරන්නේ මගේ ප්‍රකාශයක් සම්බන්ධව නෙවෙයි.වෙනත් අයෙක්ගේ ප්‍රකාශයක් සම්න්ධව කතා කරන්න අයිතියක් නෑ.නමුත් මගේ නම පාවිච්චි කරලා මම පසුගිය සභාවේ මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කරලා තිබුණා.ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා සභා වාර්තාවේ සංශෝධන යටතේ දෙවන පිටුවේ ප්‍රකාශයක් සිදු කර තිබෙනවා."ඊයේ දිනයේ ගරු උප සභාපතිතුමා ප්‍රමුඛ පොදුජන පෙරමුණේ මන්ත්‍රී කණ්ඩායම රජයේ දේපලවලට ගිනි තැබීමට තැත් කිරීම පිළිබඳ අවස්ථාව" කියලා තිබෙනවා.වගකීමෙන් කටයුතු කරන ප්‍රධාන පක්ෂයක මන්ත්‍රීවරු විදියට අපි මොනම හේතුවක් නිසාවත්,මොනම අවස්ථාවකවත් රජයේ දේපල වලට හානි කිරීමට,ගිනි තැබීමට අපි තැත් කරලත් නෑ,අපි

යොමු වෙන්නේත් නෑ.මේක ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතාගේ ප්‍රකාශයක ඇතුලත් වී තිබෙනවා.ඒ නිසා මේ ප්‍රකාශ සම්බන්ධව මගේ විරෝධය මම ප්‍රකාශ කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා - (එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමණි,මම පසුගිය සභා වාරයේ ඉල්ලීමක් කලා ඊට පෙර සභා වාරයේ සිදු වූ සිදුවීම සම්බන්ධව මා කතා කල දේ වාර්තාගත කරන්න කියලා.ඒ සිද්ධිය සිදු වී පසුදින තමයි අපේ මහා සභාව තිබුණේ.එහි දී හැසිරුණ ආකාරය,ක්‍රියා කල ආකාරය සම්බන්ධව මම ප්‍රකාශ කලා. ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා,ඔබතුමා එදා මගේ කොට්ඨාසයේ අපේක්ෂකතුමෙකුට කසිප්පුකාරයා කියලා ආමන්ත්‍රණය කලා.මමයි ඉල්ලීම කලේ රෙකෝඩින් එක බලලා වාර්තා කරන්න කියලා.නැගිටලා කතා කරන දේවල් වාර්තාගත වෙනවා.ඒ සියලුම සිදුවීම වාර්තාගත කරන ලෙස මම ඉල්ලීමක් කලා.ඒ සියලු කාරණා වාර්තාවට ඇතුලත් කර තිබෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,එතුමා වගකීමෙන් ප්‍රකාශ කරනවා නම්,මේ වාර්තාවක් කෙටුම්පත් කරලා ඔබතුමාත්,ලේකම්තුමාත් කියවලා බලලා තමයි මුද්‍රණය කරලා අපිට ලබා දෙන්නේ.ඒ නිසා මූලාසනයෙන් අවසර අරන් එතුමා සඳහන් කල ආකාරයට කතා කිරීම තමයි නෛතික කතාවක් බවට පත් වෙන්නේ.එතුමාගේ කතාවට බාධා කිරීමක් තමයි මම එදා සිදු කලේ.මම ඒක බොහෝම වගකීමෙන් කියනවා.මම කිසිම කෙනෙකුගේ නම් ගම් සඳහන් කලේ නෑ.මීට පෙර වාර්තාවේ සියලු කරුණු වැදගත් විදියට ඇතුලත් වී තිබෙනවා.ඒ වාර්තාව පිළිබඳව අපි කිසිදු වචනයක් සඳහන් කරන්නේ නෑ.අපි සියලු දෙනා අතර වචන හුවමාරු සිදු වෙනවා.නමුත් ඒවා වාර්තාගත වෙනවා ද කියන එක විශේෂ කාරණයක්.ඒ නිසා එහෙම සඳහන් කරනවා නම් මින් ඉදිරියට අපිත් අපේ මූලික ප්‍රකාශයම බලාපොරොත්තු වෙනවා.ඔබතුමන්ලාගේ වගකීම තමයි සංක්ෂිප්ත කරලා මේ වාර්තාව ඉදිරිපත් කිරීම.නැතිනම් මේ වාර්තාව බලද්දී බොහෝම අපකීර්තිමත් විදිහට තිබෙන්නේ.මේක වැදගත් සභාවක්.මේකේ කසිප්පුකාරයින්,කුඩුකාරයින්,ගණිකා වෘත්තිකයන් යනුවෙන් සඳහන් වෙනවා.මේවා වාර්තාවක ඇතුලත් විය යුතුයි කියලා මම හිතන්නේ නෑ.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීවරුණි,ගරු මන්ත්‍රීවරියණි,මේ වාර්තාවක් ලේඛනගත කරන විට ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කරන සියලුම වචන මේකේ අන්තර්ගත කරන්න බෑ.වාර්තාව සකස් කරන්නේ සාරාංශයක් හැටියටයි.ඒ වගේම එක් එක් මන්ත්‍රීවරු පුද්ගලයින්ගේ නම් කියලා චරිත ඝාතනය කිරීම්,අසභ්‍ය වචන වාර්තාවට ඇතුලත් කරන්න අවශ්‍ය නෑ කියන එක රීති වල තිබෙනවා.

ඒ අනුව 2022.01.11 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.01.11 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා විසින් 2021.12.14 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.ගරු මන්ත්‍රීතුමණි,පසුගිය කාල සීමාව තුල අපි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා.එකක් තමයි බණ්ඩාරකොස්වත්ත ළිඳ ඉදි කිරීම.සභාවේ ප්‍රතිපාදන වෙන් කරලා එම ළිඳේ කටයුතු දැන් සාර්ථකව නිම වෙමින් පවතිනවා.අපිට විවිධ ගැටළු,චෝදනා,පැමිණිලි ආවා.ඒ නිසා අපිට සිදු වුණා පළාත් පාලන කොමසාරිස්තුමාගේ,තාක්ෂණ නිලධාරීන්ගේ හා අදාල අනෙකුත් නිලධාරීන්ගේ උපදෙස් මත ඒ ළිඳේ කටයුතු සාර්ථකව කරගෙන යන්න.තව දින කිහිපයකින් ළිඳේ වැඩ අවසන් කරන්න පුළුවන්.ඊට පසුව සභාවට විශාල මුදලක් එකතු කර ගන්න පුළුවන් මේ ළිඳෙන් ජලය සැපයීමෙන්.ඒ වගේම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දී අපිට චෝදනා ගණනාවක් ආවා.මම නැවතත් අවධාරණය කරනවා,සැපයුම්කරුවන් අතර තරඟයක් ඇති කිරීම සඳහා මේ ප්‍රදේශයේ ඕනම තැනකින් සභාවේ සැපයුම්කරුවන් ලියාපදිංචි කරන්න පුළුවන්.අපේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කැඩිලා සති තුනක් විතර.අපි මිල ගණන් කැඳවූවා.ඒ මෝටර් ග්‍රේඩරයට මිල ගණන් ඉදිරිපත් කර තිබුණා නව ලක්ෂ අනූ අට දහසක්.ටෙන්ඩර් දෙකයි ඇවිත් තිබුණේ.ඉන් පසු අපි කමිටුවේ කතා කරලා මිල ගණන් වැඩි නිසා නැවත මිල ගණන් කැඳවූවා.ඒ මිල ගණන් කැඳවනකොට අපේ සමහර මන්ත්‍රීවරු අපිට චෝදනා කලා.දෙවන වතාවේ මිල ගණන් කැඳවපුවාම මිල ගණන හාරලක්ෂ පනස්අට දහසට අඩු උනා.හැබැයි දෙන්නයි හිටියේ.එක් අයෙක් ඉදිරිපත් නොකලා නම් මිල ගණන් ඉදිරිපත් කරන්නේ එක්කෙනයි.ඒකේ ඒකාධිපති ස්වභාවයක් තිබෙනවා.ඒ නිසා මේ යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම සඳහා

විධිමත් ආයතන මේ සම්බන්ධයෙන් ලියාපදිංචි කරන්න කටයුතු කරන්න. මිල ගණන භාරලක්ෂ පනස්අට දහසට අඩු කරලා දීලා තිබෙන්නේත් ඒ අයට ලාභයක් තියාගෙනනේ.මේ සභාවේ සල්ලි කොහෙටද යන්නේ බලන්න.මහජන නියෝජිතයින් විදිහට,දේශපාලන අධිකාරිය හැටියට අපි දෙන තීරණ නිලධාරීන් ක්‍රියාත්මක කරන්න ඕන.හැබැයි එවැනි දේවල් වලක්වන්න කටයුතු කරන එක අපේ යුතුකමක් හා වගකීමක්.ඒ නිසා මම පුළුවන් තරම් උත්සාහා කලා අලුතෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කරන්න.ඒකේ ප්‍රතිපල අද සභාවට ලැබී තිබෙනවා.දෙවන වර ටෙන්ඩර් කැඳවීමේ දී අපිට කොන්දේසි දාන්න සිදු වුණා.එක ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරලා තිබුණා,හය මාසයක් වගකීමක් ලබා දෙනවා කියලා.තරගයක් තිබුණ නිසා එක එක්කෙනා වැඩිපුර අපිට සහන ලබාදෙන්න ඉදිරිපත් වුණා.මේකේ වාසිය ලැබෙන්නේ ප්‍රාදේශීය සභාවටයි.අපිට යම් යම් චෝදනා කලා යටින් ගේම් ගහනවා කියලා.අපි එහෙම කරන්නේ නෑ.අද ඔබතුමන්ලාට පේනවා මේ මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීමේ දී කොපමණ මුදල් ප්‍රමාණයක් අපි ඉතිරි කරලා තිබෙනවාද කියලා.ඉදිරියේ දී කවුරු සභාවේ සභාපති වුණත් ඒකාධිකාරයක් තියන්න එපා.මිල ගණන් කැඳවීම් වල දී අපිට ගන්න පුළුවන් හැම තැනකින්ම ගන්න.නැතිනම් වාහන හදනවා,දවසයි දෙකයි කැඩෙනවා.මේ හදන්න පිළිගත් ආයතනවලට දෙන්න,ඒ අයගේ වගකීම් සහතික ගන්න.මේ අහිංසක මිනිස්සු මේවාට ගෙවන සල්ලි,දඩ මුදල්,කුලී මුදල් පිළිබඳව බොහෝම අරපරිස්සමින් විනිවිදභාවයෙන් කටයුතු කරන්න ඕන.

පසුගිය කාලයේ අපිට විවිධ ප්‍රශ්න ආවානේ.ඒ නිසා ඔබතුමන්ලා බොහෝම කල්පනාවෙන් වැඩ කරන්න.උද්ඝෝෂණ කරන්න.උපවාස කරන්න.ඒවා අයිතීන්.අපි කවුරුත් දන්නේ නෑ,අපි දෙගොල්ලන්ටම හොරෙන් ඇවිත් වෙනත් පුද්ගලයෝ ඔබට හෝ අපිට හානියක් කරන්න මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න පුළුවන්.ඒ නිසා එවැනි අවස්ථාවල බොහෝම කල්පනාවෙන් ඒ කටයුතු සිදු කරන්න.

පෙර පාසල් පාලිකාවන් සඳහා පස් වෙනිදා අපි වැඩසටහනක් පැවැත්වූවා.ඒක ඉතාම වටිනා වැඩසටහනක්.ප්‍රධාන පෙර පාසල් පාලිකාතුමිය තමයි ඒක සංවිධානය කරලා තිබුණේ.විජේරත්න දිසානායක ප්‍රවීන නර්තන ශිල්පියා ඇතුළු කලාකරුවන් ස්වේච්ඡාවෙන් මේ ස්ථානයට ඇවිත් අපේ පෙර පාසල් පාලිකාතුමියන්ලාට බෙර වාදනය පිළිබඳව වැඩසටහනක් පැවැත්වූවා.ඒක ඉතාම අගය කරන්න ඕන.ස්වේච්ඡාවෙන්ම අපේ සභාවට ඇවිත් අපේ පෙර පාසල් පාලිකාතුමියන්ලාට බෙර වාදනය පිළිබඳව අවබෝධයක් ලබා දීම සම්බන්ධව විජේරත්න දිසානායක ප්‍රවීන නර්තන ශිල්පියාටත් එතුමන් සමඟ පැමිණි අනෙක් කලාකරුවන්ටත් මම ස්තූතිවන්ත වෙනවා.එම වැඩසටහන සංවිධානය කල ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් අපේ ගෞරවය හා ස්තූතිය පිරිනමනවා.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සංනිවේදන.

## I.නිවාඩු අනුමත කිරීම.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)**</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල් .ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදීප් සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය හා ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමණි,විශේෂ නිවේදන යටතේ සභාවේ මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීම සම්බන්ධව කතා කලා.ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,මේ සම්බන්ධව හදිසි යෝජනාවක්ද මොකක්ද ඔබතුමා ඉදිරිපත් කරන්නේ.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමා,හදිසි යෝජනාවක් නෙවෙයි. විශේෂ නිවේදන යටතේ ඔබතුමා මේ සම්බන්ධව ඉදිරිපත් කලානේ.ඒ සම්බන්ධව ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දෙන්න කියලායි ඉල්ලන්නේ.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු උප සභාපතිතුමා,සුළු කාලයක් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්නම්.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>**

ගරු සභාපතිතුමා මේ මෝටර් ග්‍රේඩරය සම්බන්ධව කතා කල ආකාරයට ඒකාධිකාරය කැඩීම සම්බන්ධව ගොඩක් සතුටු වෙනවා.සභාවට වෙන්න ගිය රුපියල් ලක්ෂ පහක විතර අලාභයක් අපි මැදිහත් වෙලා නවත්වා ගන්න කටයුතු කලා.දිගින් දිගටම සුනිල් හේමචන්ද්‍ර දිසානායක ගරු මන්ත්‍රීතුමා කතා කලා මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කිරීමේ මිල ගණන් සම්බන්ධව.හේනේගෙදර ගරාජ් එකෙන් නව ලක්ෂ අනූ දෙදහසක මිල ගණනක් එවලා තිබුණා.නැවතත් එම ආයතනයෙන්ම හත්ලක්ෂ ගණනක මිල ගණනක් සුනිල් දිසානායක මන්ත්‍රීතුමා අතේ ගෙනාවා කීවා.ඒක අඩුයි.හත් ලක්ෂ ගණනට ඒක දෙන්න කතා කලා.ඊට පසුව අපි දැඩි සේ විරුද්ධ වුණා.ලේකම්තුමාත් අත්සන් කරන්නේ නෑ කියලා කීවා.ඊට පසුව නැවත මිල ගණන් කැඳවන්න තීන්දු කලා.ලියාපදිංචි තැපැලෙන් සභාවට මිල ගණන් ඇවිත් තිබුණා.හේනේගෙදර ගරාජ් එකෙන් රුපියල් හාරලක්ෂ අනූතුන්දහසකට ඒ මිල ගණන ඉදිරිපත් කරලා තිබුණා. සුනිල් හේමචන්ද්‍ර දිසානායක ගරු මන්ත්‍රීතුමා හත් ලක්ෂ ගණනක මිල ගණන එදා අතේ අරන් ආවා කීවා.එදා ඇයි ඔබතුමාට හාරලක්ෂ අනූතුන්දහසකට අදාල මිල ගණන ගෙන ඒමට නොහැකි වුණේ.ටෙන්ඩර් විවෘත කරන්න කලින් අපේ මන්ත්‍රීවරු දුරකතනයෙන් කතා කරලා කියලා තිබෙනවා.ඒක බලලා තමයි මේ අය ඉදිරිපත් කරලා තිබෙන්නේ.නැතිනම් මේක ලක්ෂ හතරකටත් වඩා අඩුවෙන් කරන්න පුළුවන් වැඩක්.මේකේ තවත් විශාල මුදලක් අඩු කරන්න තිබුණා.ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාට මතක් කරනවා මේ වාහන අලුත්වැඩියා කරන්න පුළුවන් ආයතන ඔබතුමන්ලාගේ ප්‍රදේශ වල තිබෙනවා නම් සභාවේ ලියාපදිංචි කරන්න.තාමත් මේකේ ඒකාධිකාරය කැඩිලා නෑ.අපි සියලු දෙනා එකතු වෙලා රුපියල් ලක්ෂ පහකට වඩා අධිකව විනාශ වෙන්න ගිය මුදල් නාස්තිය නවත්වන්න අපි කටයුතු කලා.ඒ මුදල් තනි කෙනෙකුගේ සාක්කුවට වැටෙනවාට වඩා මහජනතාවගේ මුදල් ආරක්ෂා කිරීමේ කටයුත්ත අපිට ඉෂ්ට

කිරීමට හැකියාව ලැබීම පිළිබඳව ඇත්තටම සතුටු වෙනවා.අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**

ගරු සභාපතිතුමණි,මේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හා මිල ගණන් සම්බන්ධ ගැටළුව මේ සිද්ධියට පමණක් අදාල දෙයක් නෙවෙයි.අපි දැක්කා මුදල් කමිටුවේ දී ඒකාධිකාරයක් තිබුණා.නව ලක්ෂ අනූ දහස් ගණනකට එකක් එනකොට අනෙක් එක නවලක්ෂ දෙදහසකට මිල ගණන් ඉදිරිපත් වෙලා තිබුණා.මිල ගණන් දෙක පැහැදිලිවම වැඩියි.මේකට විවිධ අය මැදිහත් වුණා.මේ දෙන්නත් අඹ යහළුවෝ වගේ.ඒ නිසා මේ සැපයුම්කරුවෝ අතර තරඟයක් තිබුණේ නෑ.පසුව හත් ලක්ෂ හැත්තෑ පන් දහසකට මිල ගණන අඩු උනා.ඒකත් රුපියල් හාරලක්ෂ ගණනක් දක්වා අඩු උනා.මේ තරම් අයථා මුදල්,මේ පඬුවස්නුවර ජනතාවගේ මුදල් ටික.පඬුවස්නුවර ජනතාව වෙනුවෙන් වැඩ කරන්න තිබෙන මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියාවට මෙච්චර මුදලක් ගෙවීමත් මෙච්චර ලාභයක් සැපයුම්කරුවන් ලබා ගැනීමත් නිසා නාස්ති වන්නේ ජනතාවගේ මුදල්.මම නම් සැපයුම්කරුවන් කවුරුත් ළඟට ගියේ නෑ.මේ එක කාරණයක්.වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගන්න පුළුවන්. සැපයුම්කරුවන් ඉදිරිපත් කර තිබෙන අඩුම මිල ගණනට මිල දී ගැනීමට අනුමැතිය ලබා දෙනවා.මේක එක සිද්ධියක් පමණයි.සමහර සැපයුමුකරුවන් වෙළඳපලේ තිබෙන මිල ගණනට වඩා වැඩි මිල ගණනක් මෙහි දී ඉදිරිපත් කරනවා.සැපයුම්කරුවන් අතර තරඟයක් නැති නිසා අපි ඒ සඳහා අනුමැතිය ලබා දෙනවා.මේක ලක්ෂ නවයයි ගණනේ ඉඳන් ලක්ෂ හතරයි ගණනක් වෙනකම් අඩු වුණා.හැබැයි අපි දන්නවා මේ සැපයුම්කරුවන් අතර තරඟයක් නෑ.කිහිප දෙනෙකුගේ ඒකාධිකාරයක් තිබෙනවා මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී.සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දී එක්කෙනෙක් දෙන්නෙක් නෙවෙයි.කිහිප දෙනෙක් ලියාපදිංචි කරන්න.මේ අවිධිමත්භාවය නිසා ලක්ෂ ගණන් ජනතාවගේ මුදල් නාස්ති වෙන්නේ.ඒ නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**

ගරු උප සභාපතිතුමා කීව කාරණය මම ප්‍රතික්ෂේප කරනවා.ඒකට හේතුව මෝටර් ග්‍රේඩරය සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් තිබුණා මේ නිලධාරීන් එක්ක.ඒ අවස්ථාවේ මම එන්න ටිකක් ප්‍රමාද උනා.ඒ ප්‍රමාද උනේ මේ කාරණය සම්බන්ධයෙන් පරිභාහිරව මම යම් තොරතුරු විමසීමක් කලා.හැබැයි මම එනකොට ඔබතුමාලා කටයුතු ප්‍රමාණයක් අවසන් කරලා හිටියේ.ඊට පසු මම ඇවිත් මෙතන මිල ගණන් වැඩියි,ඊට වඩා අඩු මුදලකට කරන්න පුළුවන් කියන කාරණය කීවා.එතකොට ගරු උප සභාපතිතුමා මට කීවා හත් ලක්ෂ ගණනකට අඩු උනේ මොකද කියලා.එදා සමිත මහත්මයාගෙන් මම ඇහුවා එදා ගෙන්වපු මිල ගණන් වල වර්ග කීයක් තිබෙනවාද කියලා.අර මනුස්සයාට දුන්න අයිටම් වලත්,මේ මනුස්සයාට දුන්න අයිටම් වලත් පරස්පරතාවක් තිබුණා.එතුමා ඒක පිළිගත්තා.අපේ ලේකම්තුමාත් පිළිගත්තා යම් කිසි අඩු පාඩුවක් අපෙන් සිද්ධ වෙලා ඇති කියලා. ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතාට ඒ අදාල ආයතනයේ මනුස්සයාව ඕන නම් මුණගස්වන්න පුළුවන්.මේක විනිවිදභාවයෙන් කරන්න.මම සද්භාවයෙන් මේකට මැදිහත් වුණා.මම මේකෙන් රුපියලක්වත් අරගෙන නෑ.හැබැයි තැපැලෙන් නෙවෙයි නිලධාරීන් ඒ අදාල ස්ථානයට ගිහින් තමයි මිල ගණන් ඉල්ලුවේ.හැබැයි එදා මුදල් කමිටුවේ දී තීරණයක් ගත්තා විද්‍යුත් තැපැලෙන් මිල ගණන් කැඳවන්න කියලා.මේකේ ඒකාධිකාරය බිඳින්න ඕන.එදා මුදල් කමිටුවේ අපි කතා කරද්දී කීවා මේක විද්‍යුත් තැපැලෙන් ඉදිරිපත් කරන්න අර පිරිවිතර වලට කියලා.කමිටුවෙන් පසුව තමයි ඔය අදාල අයිතම හයට හෝ පහට මිල ගණන් කැඳවූවේ.ඒක තමයි ඇත්ත කතාව.අපි ඇත්ත කියනකොට අපිත් එක්ක තරහා වෙනවා.මේ සභාවෙන් රුපියලක දෙයක්වත් මම අරගෙන නෑ.මම ඔබතුමාට පැහැදිලිවම කීවා මම මේ මිල ගණන් වලට විරුද්ධයි කියලා.කවුද හරි කියන එක නෙවෙයි.විනිවිදභාවයෙන් කටයුතු කරමු.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**

මේ සම්බන්ධව වචන කිහිපයක් කතා කරන්න මම කැමතියි.මෝටර් ග්‍රේඩරය අලුත්වැඩියා කටයුතු කරද්දී මුලින්ම ලක්ෂ නවයයි ගණනකට තමයි මිල ගණන් කැඳවූවේ.මිල ගණන් කැඳවලා තිබෙන්නේ එක එක ආයතනවල අය සම්බන්ධ කරගෙන.ලක්ෂ නවයයි ගණනකට මෝටර් ග්‍රේඩරයේ වැඩ විෂයන් 16 ක් තිබුණා.නැවත මිල ගණන් කැඳවද්දී වැඩ විෂයන් 05කට තමයි ඒ ලක්ෂ හතරයි ගණනක මිල ගණන් ඉදිරිපත් කර තිබෙන්නේ.ලක්ෂ හතරයි ගණනට කලත් නැවත වැඩ විෂයන් කිහිපයක් තිබෙනවා මෝටර් ග්‍රේඩරයේ කරන්න.ඒ අනුව තමයි මේ මුදල අඩු වී තිබෙන්නේ.පැහැදිලිවම මේ ආයතනවල අය එක්කෙනෙකුට එක්කෙනෙක් සම්බන්ධයි.එක ආයතනයක පුද්ගලයෙක් මම ඉන්න තැනම කීවා මන්ත්‍රීවරයෙක් ඇවිත් කීවාලු මේක අඩු කරලා දෙන්න කියලා.නිසි ක්‍රමවේදයකට ගියා නම් නැවත

මන්ත්‍රීවරු ගිහින් එතන බලපෑම් කරන්න ඕන නෑනේ.ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා,ඔබතුමා නිලධාරීන් සමඟ නිසි ක්‍රමවේදයකට මේක කරන්න.එතකොට ගැටළුවක් නෑ.එක් ආයතනයකින් මිල ගණන් ඉදිරිපත් කල අයට නැවත මිල ගණන් දෙන්න කියලා අනෙක් අය බලපෑම් කරනවා.මුලින් වැඩ විෂයන් 16 කට මිල ගණන් කැඳවලා තිබෙන්නේ.පසුව අපේ තාක්ෂණ නිලධාරී මහතාගේ නිරීක්ෂණය කිරීමෙන් පසු වැඩ විෂයන් පහකට හෝ හයකට තමයි මිල ගණන් කැඳවලා තිබෙන්නේ.හැමදාම මිල ගණන් කැඳවනවා,ආයේ වෙනස් කරනවා.නිසි ක්‍රමවේදයකට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරනවා.මිල ගණන් කැඳවද්දී අපේ වැඩේ කෙරෙන ආකාරයට,අඩු මුදලකට,වගකීමක් සමඟ කටයුතු කල හැකි ආකාරයට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා.සභාවේ මුදල් ඉතිරි කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ලංකාදීප පුවත්පතේ පසුගිය පුවත්පතේ නෙවෙයි,ඊට කලින් පුවත්පතේ තිබුණා එක් ප්‍රාදේශීය සභාවක ට්‍රැක්ටර් ටේලර් දෙකක් අලුත්වැඩියා කිරීමට ලක්ෂ 32 ක් කියලා.ප්‍රාදේශීය සභාවක සිදු වුණ දෙයක්.ඒක අලුතෙන් ගන්න ලක්ෂ අටයි.ටේලරයක් ලක්ෂ හතරයි.එතකොට මොන තරම් වංචාවක් සිදු වෙනවා ද බලන්න.එතකොට අපේ මේ අහිංසක ජනතාවගෙන් එකතු කරන බදු මුදල් නෙවෙයිද?අපි මේ මැෂින් ක්ෂේත්‍රයේ වසර ගණනාවක ඉඳන් ඉන්නවා.අපිමයි ගලවලා හදා ගන්නේ.අපි ඒක කම්පැනියකට දැම්මොත් ලක්ෂ 50යි,60 යි.නමුත් රුපියල් පන්සීයෙන්,දහසෙන්,දස දහසෙන්,විසි දහසෙන් කර ගන්න පුළුවන් වැඩේට ලක්ෂ දහය විස්ස දානවා.අපිට පුළුවන් නම් ප්‍රාදේශීය සභා කිහිපයක් හරි එකතු වෙලා වර්ක් ෂොප් එකක්,මම හිතන්නේ වාරියපොල වර්ක් ෂොප් එකක් තිබෙනවා.පුද්ගලික එකක්ද ප්‍රාදේශීය සභාවේ එකක්ද මම දන්නේ නෑ.වාරියපොල ප්‍රාදේශීය සභාවේ වාහන ඔක්කෝම හදන්නේ ඒ වර්ක් ෂොප් එකේ.අපේ කාර්මික මහතෙක් යොදවලා අපි වාහන ගලවා ගත්තොත් අපිට අඩු මුදලකට මේක හදා ගන්න පුළුවන්.මම ඇස් දෙකෙන් දැකලා තිබෙනවා.මේ ප්‍රාදේශීය සභාවේ නෙවෙයි,මම හිතන්නේ ඒ වෙනකොට මෝටර් ග්‍රේඩරයක් ලක්ෂ අනූවයි,අනූ පහයි.ලක්ෂ 52 ක අලුත්වැඩියා බිලක්.ඒ එක අලුත්වැඩියාවක්.අවුරුදු දෙක තුනක අලුත්වැඩියා කටයුතු සිදු කරද්දී මෝටර් ග්‍රේඩර් පහක් ගන්න සල්ලි අපි අලුත්වැඩියා කරන්න එක එක මිනිස්සුන්ට නිකම් දීලා.ඒ නිසා මම යෝජනාවක් හැටියට කරනවා ලේකම්තුමා හෝ කුවුරුන් හෝ කතා කරලා අපේ අවට ප්‍රාදේශීය සභා කිහිපයක් එක්ක එකතු වෙලා හරි කමක් නෑ,අපේ ප්‍රාදේශීය සභා භූමියේ හරි කමක් නෑ.ඕන තරම් කාර්මිකයෝ අපිට අඩු මුදලට ගන්න පුළුවන්.අපේම වර්ක් ෂොප් එකක් හැදුවොත් මේ අපතේ යන සියලුම මුදල් ඉතිරි කර ගන්න පුළුවන්.ඒ වගේම අතරමැදියන්ගෙත් විවිධ අවස්ථාවල දී වටිනාකමක් තිබෙනවා.බුලත් අපනයනය කිරීමේ සිදු වීමක දී ඒ ගමේ ස්වාමීන් වහන්සේ මැදිහත් වෙලා කෙලින්ම බුලත් පකිස්තානෙට යවන්න තීරණය කලා.අවසානේ දී බුලත්පොල වහන්න වුණා.බලද්දී අතරමැදියා කරන්නේ ගොවියාගෙන් මි දී අරගෙන යනවා.අරගෙන ගිහින් ඉල්ලුම එනකම් පකිස්තානෙට යවන්නේ නෑ.ඉල්ලුම නැති වෙලාවේ යැව්වොත් කුණු කොල්ලයට ගන්නේ.අතරමැදියාගේ වටිනාකම ඒකයි.මම හිතන්නේ බිත්තර නිෂ්පාදකයන්ටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.ඒ නිසා අතරමැදියන් අවශ්‍ය වෙන අවස්ථා තිබෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,කාලවේලාව කෙසේ වුණත් මේ කාරණය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කල යුතුයි.මොකද මේ ගණුදෙනුවේ දී සභාවට අහිමි වෙන්න ගියේ ලක්ෂ පහකට අධික මුදලක්.පාරක් කොන්ක්‍රීට් කලා නම් මේ මුදලින් මීටර් 100 ක් විතර කොන්ක්‍රීට් කරලා වැඩ අවසන් කරන්න තිබුණා.අපේ සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වද්දී එතුමා කීවා ආයතන දෙකට ඉදිරිපත් කල පිරිවිතර වල වෙනස නිසා ලක්ෂ පහකට වැඩි මිල ගණන්වල වෙනසක් සිදු වී තිබෙනවා කියලා.මුලින්ම නව ලක්ෂ අනූ දෙදහසකට තමයි මිල ගණන් ඉදිරිපත් වුණේ.ගරු සභාපතිතුමණි,ඔබතුමාගෙන් දැන ගන්න කැමතියි මේක අලුතෙන්ම ලියාපදිංචි වූ ආයතනයක්ද?ප්‍රාදේශීය සභාවේ වැඩ කලින් කරලා තිබෙනවාද?

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

මීට කලින් වැඩ කරලා නෑ.නමුත් අපි දැනුවත් කලා පුළුවන් තරම් සැපයුම්කරුවෝ ලියාපදිංචි වෙන්න කියලා.ඒ අනුව තමයි ඒ අය ලියාපදිංචි වුණේ.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,ඔබතුමා විනිවිදභාවයෙන් මේ සභාව මෙහෙයවීමට දරණ උත්සාහය සම්බන්ධව සම්බන්ධව අපි ස්තුතිවන්ත වෙනවා.මීට කලිනුත් හිටපු ගරු සභාපතිතුමා හා අපේ මේ මන්ත්‍රී මණ්ඩලය හිටියේ.මේ පළාත් පාලන ආයතනයේ මුදල් ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි කැපවෙනවා.එක් වතාවක් අපිට මුදල් කමිටුවට ඉදිරිපත් වුනා අපිට ලැබුණු වෑන් රථය අලුත්වැඩියා කරන්න ලක්ෂ 15 කට අධික මිල

ගණනක්.ඒ අවස්ථාවේ අපි සාකච්ඡා කරලා නැවත මිල ගණන් කැඳවලා මට මතක විදිහට තුන් ලක්ෂ,හාර ලක්ෂ ගණනකට අලුත්වැඩියා කටයුතු සිදු කරන්න යෙදවූවා.ඒ සඳහා අපි ඉදිරිපත් වුණේ පරම පවිත්‍ර චේතනාවෙන්.ඒ අය ගෙන්වලා සමිත මහතාට හඳුන්වා දුන්නා.ඒ කියපු නිර්ණායකයන් මත එතුමා එකඟ වුණා එම වැන් රථය අංග සම්පූර්ණව අලුත්වැඩියා කරලා මේ සභාවට භාර දෙන්න.එතන දී අපිට ලක්ෂ 10 කට ආසන්න මුදලක් ඉතිරි වුණා.ගරු සභාපතිතුමණි,කවුරු අතින් මේ සිදුවීම වුණාද මම දන්නේ නෑ.දැන් මේ නිලධාරීන් මේකට ගාවන්න හදනවා.මේ අදහස් ප්‍රකාශ කිරීම් වලින් ගම්‍ය වන්නේ ඒකයි.ඒ නිසා මම බොහෝම වගකීමෙන් කියනවා සමිත මහතා ඉංජිනේරුතුමාගේ උපදෙස් මත වාර්තාවක් ලබාගෙන තමයි මේවා අදාල ආයතන වලට යොමු කරන්නේ.එතුමා කිසිම මැදිහත් වීමක් සිදු කරලා නෑ කියන එක මම වගකීමෙන් කියනවා.සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමා බොහෝම වගකීමෙන් කීවා සමිත මහතා වරද පිළිගත්තා,ආයතන දෙකට ඉදිරිපත් කල වැඩ විෂයන් දෙකක්.ඒ නිසා තමයි මෙච්චර මුදලක් වෙනස් වෙන්න හේතු වුණේ කියලා.උදාහරණයකට මිල ගණනක වැඩ විෂයන් දෙකක් වෙනස් වුණා නම් විසි තිස් දහසක වෙනස් වීමක් අපිට පිළි ගන්න තිබුණා.නමුත් එකම ආයතනය තුන් වතාවක් ලක්ෂ පහකට අධික ප්‍රමාණයක් අඩු කරලා පිරිවිතර දෙද්දී අපි ආයතනය පිළිබඳව දෙවතාවක් හිතන්න ඕන.සාමාන්‍යයෙන් ඕනම ආයතනයක් ඒ ආයතනයේ අභිමානය ගැන හිතනවා.කවුරු හරි මේකට මැදිහත් වුණා නම් අවංකව කියන්න මම මැදිහත් වුණා කියලා.අපි ඒක පිළිගන්න කැමතියි.එහෙම නැතිව මේකට මේ මහන්සි වෙන නිලධාරීන් ගාවලා කටයුතු කරන්න හදනවාට අපි විරුද්ධයි.ලක්ෂ 10 ක වැඩ කොටසක් ඒ ආයතනයම ලක්ෂ හතරකට මිල ගණන් ඉදිරිපත් කර තිබෙනවා.ලක්ෂ හයක් අඩු වෙන්න මොකක්ද ඒ ආයතනය.එක්කෝ ඒ ආයතනය හිතාමතාම නොමඟ යැවීමක් සිදු කරලා තිබෙනවා.එහෙම නැතිනම් මේ ආයතනය පිළිගන්න බැරි ආයතනයක් ලෙස අසාදු ලේඛන ගත කරන්න ඕන.සාමාන්‍යයෙන් ආයතනයක් යොදවන උපකරණ හා සේවාව මත තමයි මිල ගණන් තක්සේරු කරන්නේ.මොන විදිහට සඳහන් කලත් මේ ලක්ෂ හයක ගණුදෙණුව ඇතුලේ කවුරු හරි ඉන්නවා කියන එක බොහෝම පැහැදිලියි.ඒකේ වගකීම මැදිහත් වුණ අය භාර ගන්න.දැන් සුනිල් දිසානායක මහතා ප්‍රකාශ කලා,සමිත මහතා වරද භාර ගත්තා කියලා,වැඩ විෂයන් දෙකක් දුන්න නිසා තමයි මිල ගණන් ඉහල ගියේ හා පහල ගියේ කීවා කියලා ප්‍රකාශ කලා.ඒක පට්ටපල් බොරුවක්.අපි මේ සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරලා නිලධාරීන්ගෙන් මේ පිළිබඳව විමසීමක් කරමු.තමන්ගේ වගකීම තමන් භාර ගන්න.වෙනත් පාර්ශ්වයකට ඒක දාන්න එපා.ඒ අය අසරණ වෙනවා.මේ සභාවේ අරමුදල් ආරක්ෂා කරන්න ඉදිරිපත් වෙන්න.හිටපු ගරු සභාපතිතුමා ඉන්න කාලේ අපි සම්බන්ධ වුණා.දොරබාවිල තිබෙන ආයතනයක් තමයි සේවා කටයුතු සිදු කලේ.එතුමාගේ ආයතනය නරකයි කියනවා නෙවෙයි.නමුත් නවීන තාක්ෂණ උපකරණ පාවිච්චි කරලා ජෙට්ලෝ වැනි ආයතන නිර්මාණය වුණා.ඉතිං අපි එතුමාට කීවා සභාවේ ලියාපදිංචි වෙන්න කියලා.ඉන් පසු අපේ සභාවට පහසු මිලට සේවා සපයලා දෙන්න කීවා.මේ සියලුම මන්ත්‍රීවරුන්ට සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට කලින් සේවා පහසුකම් සැපයීමට ලියාපදිංචි වෙන්න පුළුවන්.අතරමැදියන් විදිහට මේවාට මැදිහත් වෙලා මේ සභාවේ මුදල් ගසා කාලා ජනතා මුදල් විනාශ කරලා ඒ සිදු කරන පාපය තවත් පුද්ගලයකු පිට පටවන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා.මේක ඔබතුමා එක්කෝ ඉල්ලා අස් කර ගන්න.එහෙම නැතිනම් ඒ වගකීම ගන්න.ගරු සභාපතිතුමණි,ඔබතුමා මේකේ වගකිවයුත්තා.ඔබතුමායි තීරණය ගන්න ඕන.ලක්ෂ හතකට ආසන්න මුදලක අත යට ගණුදෙණුවක් සිදු වෙන්න ගියා කියන දේ බොහෝම පැහැදිලිව මගේ මනසට දැනෙනවා. මුදල් කමිටුවට සහභාගී වී මේ කටයුතු නිවැරදිව සිදු කිරීම සඳහා ක්‍රියා කල සියලු ගරු මන්ත්‍රීවරුන්ට හා ලේකම්තුමාට ස්තුතිවන්ත වෙනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>**

සුනිල් දිසානායක ගරු මන්ත්‍රීතුමාගේ කතාවේ දී එතුමා කීවා මට රත්මුළුකන්දේ ඒ ආයතන ප්‍රධානියා මුණගස්වන්නම් කියලා.ඔබතුමාට මම පැහැදිලිවම කියන්න ඕන.මම මේ වනතුරු කිසිම ආයතන ප්‍රධානියෙක් හමු වෙලා කතා කරලා නෑ.ඔබතුමා ගිහින් කතා කරන්න ඇති.හැබැයි මට අවශ්‍යතාවකුත් නෑ රත්මුළුකන්දේ ඒ ආයතන ප්‍රධානියා එක්ක කතා කරන්න.එදා අපේ සාකච්ඡාවේ දී අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ගිහින් සාකච්ඡා කලා.ඒ වෙලාවේ ඔබතුමා යන්න ඇති.ඔබතුමාලා එදා ගිහින් කතා කරලා එන්න ඇති.හැබැයි නව ලක්ෂ අනූ දහස් ගණනක් වූ පළමු මිල ගණන එතුමා සමඟ සාකච්ඡා කරන කොට හත් ලක්ෂ ගණනකට අඩු කරන්න එකඟ වුනා.එදා මුදල් කමිටුවට දාන්න කලින් අපි බලද්දි හත්ලක්ෂ හැත්තෑපන්දහස් ගණනක් තිබුණා.හැබැයි අපිට කුතුහලයක් ඇති වුණා මොකද නව ලක්ෂ අනූ දහස් ගණනක් වුණ දේ එක පාරටම හත්ලක්ෂ හැත්තෑපන්දහසට අඩු වුණේ කියලා.සාකච්ඡා කරන කොට අපිට දැන ගන්න ලැබුණා ගිහින් බලපෑමක් කරලා තිබෙනවා මේක ඔබතුමාම ගන්න ඕන කියලා.එහෙම බලපෑමක් කරලා, කරන්න දෙයක් නැතිකමට තමයි මේක දුන්නේ කියලා කියලා තිබෙනවා.ඒ කියපු අයම ඇවිත් මේ අයට මේක දුන්නා කියනවා.ඇත්තද බොරුද මම දන්නේ නෑ.මේ කියන කාරණා කියන්නේ.ඉන්

පසු මුදල් කමිටුවට මේක ආවා.මුදල් කමිටුවේ අපි සියලු දෙනා හිටියා.අපි සියලු දෙනාම කතා කලා.ලේකම්තුමා පැහැදිලිවම කීවා මම මේකට අත්සන් කරන්නේ නෑ කියලා.ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාම ඒකමතිකව තීන්දු කලා මේක තවත් වැඩියි,නැවත මිල ගණන් කැඳවන්න කියලා.ගරු මන්ත්‍රීවරුන්ට ඇත්ත දැන ගන්නයි මේ කියන්නේ.ඉන් පසු මම හිතන්නේ එකක් තැපෑලෙන් ආවා.අනික අතින් ගෙනත් භාර දී තිබුණා.එහෙම භාර දෙන්න පුළුවන්ද බැරිද කියන එක නීති රීති එක්ක සභාව සතු දෙයක්.ඉන් පසු අපි නැවත මුදල් කමිටුවක් කැඳවුවා.එහි දී තිබුණේ හාරලක්ෂ ගණනක්.එතකොටත් අපි තීන්දු කලේ නෑ.සේවා සපයන්නේ මොන ආකාරයටද කියලා අපිට දැන ගන්න අවශ්‍ය උනා.එදා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතා ඇවිත් සිටියා.අපි එතුමාට යොමු කලා මේක බලලා දෙන්න සුදුසු කෙනා තොරලා දෙන්න කියලා.ඉංජිනේරුතුමා දැන් ඒක සකස් කරලා මම හිතන්නේ අදාල ආයතනයට භාර දෙන්න කටයුතු කරලා ඇති.අපි මුදල් කමිටුවේ සාකච්ඡා කරලා නිලධාරීනුත් ආරක්ෂා කරගෙන, අපි සිදු කලේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අහිමි වෙන්න ගිය ලක්ෂ පහක විතර මුදලක් ඉතිරි කිරීමයි.ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා.අවසාන මොහොතේ හෝ ඒ ආයතනය ලියාපදිංචි කල නිසා තමයි අද මේක මේ ආකාරයෙන් සිදු කර ගන්න හැකි වුණේ.ඒ වගේම එදා ලේකම්තුමා අත්සන්කලා නම් අපි ඒකට අනුමැතිය ලබා දෙනවා.හැබැයි එතුමාත් ඒක අනුමත නොකර කෙලින් හිටියා.සියලු දෙනාගේ අදහස් සාකච්ඡා තුලින් අපිට හැකියාව ලැබුණා පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අහිමි වෙන්න ගිය ලක්ෂ පහක විතර මුදලක් ඉතිරි කර ගන්න.කාටවත් ලකුණු දාන එක නෙවෙයි විය යුත්තේ.මහජන නියෝජිතයෝ විදිහට අපිව එවලා තිබෙන්නේ ගම්වල ඉන්න අහිංසක මිනිස්සුන්ට යම් වැඩ කොටසක් කරන්න.පාරට කොන්ක්‍රීට් ටිකක්,බොරළු ටිකක් දා ගන්න, මෝටර් ග්‍රේඩරයෙන් පාර හදා ගන්න,වීථි ලාම්පුවක් දා ගන්න,මේවා තමයි මිනිස්සුන්ගේ බලාපොරොත්තු.ලේකම්තුමණි,මේක තවත් පුළුල් කරලා තවත් ආයතන ලියාපදිංචි කර ගන්න.තරඟයක් ඇති වුණාම මේ කටයුතු කරන්න පහසුයි.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරුණි,මේකේ ගරුත්වය ඒ සඳහා සම්බන්ධ වූ සියලු ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්න ඕන.ඔබතුමන්ලා එදා මේ ප්‍රශ්නය කතා නොකරන්න අපි නවලක්ෂ අනූ අට දහසට මෝටර් ග්‍රේඩරය හදන්න දෙනවා.රත්මුළුකන්දේ ආයතන හිමිකරු මේ සභාවේ ලියාපදිංචි නොවුණා නම් අපිට ටෙන්ඩර් ඉදිරිපත් කරන්න වෙන කවුරුත් නෑ.නවලක්ෂ අනූ අට දහසට අපිට දෙන්න වෙනවා.මින් පසු මිල ගණන් කැඳවන ඒවා අතින් ගෙනත් දීලා බෑ.ලියාපදිංචි තැපෑලෙන් සභාවට එවන්න ඕන.ටෙන්ඩර් බෝඩ් ඒක,නැතිනම් මුදල් කමිටුව ඉදිරියේ ලියාපදිංචි තැපෑලෙන් පැමිණි මිල ගණන් විවෘත කරන්න ඕන.එතන දී තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.කවුරුත් මේකට කලබල වෙන්න එපා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,ඇත්තටම මේ සිදුවීමේ දී ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මේ ආයතනය ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සම්බන්ධව.එහෙම නොවුණා නම් මේ මිල ගණන ලක්ෂ දහයටත් වඩා ඉහල යන්න තිබුණා.ඒ වගේම කතිකාවතක් ගියා ගරු සභාපතිතුමා සුදුසුකම් නොමැති ආයතන ලියාපදිංචි කලා කියලා.ඔය වගේ කරුණු කාරණා ගොඩක් තිබෙනවා ඔය සිදුවීමට කලින්.ඒ පුද්ගලයා ගැන මට දැන ගන්න ලැබුණා,හොඳට වැඩ කරන පුද්ගලයෙක්,අනෙකුත් රජයේ ආයතනවල වාහන අලුත්වැඩියා කරන පුද්ගලයෙක් කියලා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.11.48 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා පෙ.ව.11.48 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීවරුණි,මෙවැනි කටයුතු සම්බන්ධව මේ කිසිම නිලධාරියෙකුට වරද පටවන්න එපා.මොකද මේ නිලධාරීන්ට මේ වැඩ කටයුතු සිදු කරන්න නියෝග ලබා දෙන්නේ මන්ත්‍රී කණ්ඩායමේ අපි.මේ වැඩේ උනත් ලක්ෂ හතරටත් කරන්න එපා කියලා අපි කීවොත් මෙතුමන්ලා කරන්නේ නෑ.ඒ නිසා සෑම කෙනෙක්ම මේවා සද්භාවයෙන් හිතන්න.ඒ වගේම සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභාව පුවත්පත් වල පල කරනවා.හැබැයි මේවා කියවන අයත් ඉන්නවා.නොකියවන අයත් ඉන්නවා.ඒ නිසා සැපයුම්කරුවන් ඉන්නවා නම් ඒ අයට මේකට ලියාපදිංචි වෙන්න කියන්න.ජනතා නියෝජිතයින් හැටියට අපි මේ ආයතනය ආරක්ෂා කරන්න ඕන.ඒ නිසා මේ සඳහා සද්භාවයෙන් කැපවීම් කරන්න.මේ මිල ගණන් ඉදිරිපත් කල ආයතන දෙක,මේ තීන්දුව මට තනියම ගන්න තිබුණා නම් මේ දෙකම මම අසාදු ලේඛන ගත

කරනවා. නව ලක්ෂ අනු දහස් ගණනකට ඉදිරිපත් කල මිල ගණන හාර ලක්ෂ ගණනට අඩු වුණේ කොහොමද?මේවාට අධි හාරයක් ආවොත් මේ මන්ත්‍රීවරු සියලු දෙනාම බැදිලා ඉන්නේ.හිටපු ගරු සභාපති එමල් ප්‍රියන්ත හේරත් මැතිතුමා මිල ගණන් කැඳවලා නැවත දුරකතනයෙන් විමසනවා මේක තව ටිකක් අඩු කරලා දෙන්න බැරිද කියලා.ඒක වරදක්ද?ඒකෙන් ලාභයක්නේ සභාවට ලැබිලා තිබෙන්නේ.ඒ නිසා කවුරුත් මේවාට කලබල වෙන්න එපා.මේ ආයතනය ආරක්ෂා කරන්න ජනතාව අපිට විශාල බලයක් ලබා දීලා තිබෙනවා.ඒ දේ අපි කරමු.ඔබතුමන්ලා සියලු දෙනා එකතු වී සභාවට මුදල් ඉතිරි කර ගැනීමට ලබා දුන් සහයෝගය පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා පෙ.ව.11.53 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා පෙ.ව.11.53 ට පමණ ගරු සභාවට පැමිණියා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

ගරු සභාපතිතුමණි,ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කිරීම බොහෝම පැහැදිලියි.ආයතන වලට ඉදිරිපත් කර තිබෙන පිරිවිතර සම්බන්ධව හා තව දුරටත් මේ සම්බන්ධව දැනුවත් වීම සඳහා මෙම මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා - (එ.ජ.නි.ස.)**

මෙම කාරක සභා අවස්ථාව නැවත මහා සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීවරුණි,ඔබතුමන්ලා මෙම කාරණය සම්බන්ධව කාරක සභා අවස්ථාවේ අවබෝධයක් ලබා ගත්තා.ඔබතුමන්ලා සියලු දෙනා එකතු වී සභාවට මුදල් ඉතිරි කර ගැනීමට ලබා දුන් සහයෝගය පිළිබඳ නැවතත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

## II.හෙට්ටිපොල ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩි දියුණු කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වයඹ) අංක RSC (NW) /DEV /Hettipola /2022/1 හා 2022.01.11 දරණ ලිපිය මඟින්,දැනට හෙට්ටිපොල නගරය සහ ඒ අවට ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලන හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමය මඟින් මේ වන විට ජල සම්බන්ධතා 1300 ක් පමණ ලබා දී ඇති බවත්,මෙම ජල සම්පාදන ක්‍රමය සඳහා ජල මූලාශ්‍රය ලෙස කොළමුණුඔය භාවිතා වන අතර,දැනට පවතින ජල පිරිපහදුව මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය ඉතා පහල මට්ටමක පවතින බවත්,මෙහි ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා ජල පිරිපහදු පද්ධතිය සඳහා නව වාතකයක් සහ ආසාදිත ටැංකියක් (Aorator & Floculater) ඉදිකල යුතුව ඇති බවත්,ඒ සඳහා ජල පවිත්‍රාගාරය පිහිටා ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුව පර්චස් 2 ½ ක පමණ භූමි ප්‍රමාණයක් ජල පවිත්‍රාගාරයේ යෝජිත වැඩි දියුණු කිරීම සඳහා ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.තව ද,ජල පිරිපහදුවේ මෙම සංවර්ධන කටයුත්ත මඟින් ප්‍රදේශයේ ජනතාවට වඩාත් ගුණාත්මක ජලය ලබා දීම මණ්ඩලයේ අරමුණ වන අතර,යෝජිත කටුපොත,බමුණාකොටුව ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව මෙම භූමි භාගය ප්‍රාදේශීය සභාව වෙත නැවත ලබා දිය හැකි බව ද දන්වා තිබෙනවා.ඒ අනුව හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයේ දැනට පවතින ජල පිරිපහදුව මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ජල පිරිපහදු පද්ධතිය සඳහා නව වාතකයක් සහ ආසාදිත ටැංකියක් (Aorator & Floculater) ඉදි කිරීම සඳහා ජල පවිත්‍රාගාරය පිහිටා ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුව පර්චස් 2 ½ ක පමණ භූමි ප්‍රමාණයක් සභාවේ කටයුතු වලට අවහිරයක් නොවන පරිදි වසර තුනක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බදු ලබා දීමත්,ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමත් සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයේ දැනට පවතින ජල පිරිපහදුව මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ජල පිරිපහදු පද්ධතිය සඳහා නව වාතකයක් සහ ආසාදිත ටැංකියක් (Aorator & Floculater) ඉදි කිරීම සඳහා ජල පවිත්‍රාගාරය පිහිටා ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බැවින්,ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුව පර්චස් 2 ½ ක පමණ භූමි ප්‍රමාණයක් සභාවේ කටයුතු වලට අවහිරයක් නොවන පරිදි වසර තුනක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බදු ලබා දීමත්,ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.ඇත්තටම කොළමුණු ඔයේ ඇතුලේ තමයි මේ ළිඳ තිබෙන්නේ.මේ නගරයේ උනත් අපද්‍රව්‍ය බොහෝමයක් මිනිස්සු ගිහින් දාන්නේ කොළමුණු ඔයට.කිලෝ මීටරයක් විතර එහායින් තිබෙන ජල ව්‍යාපෘතියට තමයි මේවා ආපස්සට ගලාගෙන එන්නේ.ඒ අපද්‍රව්‍යාත් එක්ක තමයි නගරයට වතුර එන්නේ.මේක ලබා දෙනවාට අපේ විරුද්ධත්වයක් නෑ.සභාවක් හැටියට අපි ඒ තීන්දුව ක්‍රියාත්මක කරමු.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයේ දැනට පවතින ජල පිරිපහදුව මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ජල පිරිපහදු පද්ධතිය සඳහා නව වාතකයක් සහ ආසාදිත ටැංකියක් (Aorator & Floculater) ඉදි කිරීම සඳහා ජල පවිත්‍රාගාරය පිහිටා ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බැවින්,ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුව පර්චස් 2 ½ ක පමණ භූමි ප්‍රමාණයක් සභාවේ කටයුතු වලට අවහිරයක් නොවන පරිදි වසර තුනක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බදු ලබා දීමත්,ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව හෙට්ටිපොල ජල සම්පාදන ක්‍රමයේ දැනට පවතින ජල පිරිපහදුව මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා ජල පිරිපහදු පද්ධතිය සඳහා නව වාතකයක් සහ ආසාදිත ටැංකියක් (Aorator & Floculater) ඉදි කිරීම සඳහා ජල පවිත්‍රාගාරය පිහිටා ඇති ඉඩම ප්‍රමාණවත් නොවන බැවින්,ඉදිරිපත් කර ඇති සැලැස්මට අනුව පර්චස් 2 ½ ක පමණ භූමි ප්‍රමාණයක් සභාවේ කටයුතු වලට අවහිරයක් නොවන පරිදි වසර තුනක කාලයක් සඳහා මාසික කුලී පදනම මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බදු ලබා දීමත්,ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## III.කිතරම්මුල්ල පුස්තකාලය ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙනි.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

**කේ.එම්.එන්.සමන්කුමාරි,සංවර්ධන නිලධාරි,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව විසින් 2022.01.31 දාතමින්** ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.එමඟින් කිතරම්මුල්ල මහජන පුස්තකාලය මේ වන විට ශ්‍රේණිගත නොවූ පුස්තකාලයක් වන අතර,එහි පුස්තකාල සහායිකා මහත්මිය විසින් එම පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා ඉල්ලීම් කර ඇති බවත්,ඒ සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ඉදිරිපත් කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති බැවින්,කිතරම්මුල්ල මහජන පුස්තකාලය ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබෙනවා.ඒ සඳහා යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ඉදිරිපත් කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති බැවින්, කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමත්,ඒ සඳහා වන සේවා ගාස්තු ගෙවීම් කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ඉදිරිපත් කර ඇති

මූලික සුදුසුකම් සපුරා ඇති බැවින්, කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමත්,ඒ සඳහා වන සේවා ගාස්තු ගෙවීම් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ඉදිරිපත් කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති බැවින්, කිතරම්මුල්ල මහජන පුස්තකාලය III වන ශ්‍රේණියේ පුස්තකාලයක් බවට ශ්‍රේණිගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමත්,ඒ සඳහා වන සේවා ගාස්තු ගෙවීම් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## IV.වරිපනම් ලේඛනයන්හි නාම සංශෝධනය සිදු කිරීම.

__ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා__

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ වරිපනම් විෂය භාර සංවර්ධන නිලධාරී විසින් 2022/01/31 දාතමින් ලිපියක් මහා සභාව වෙත ඉදිරිපත් කර තිබෙනවා.එමගින් පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකරන කලාපය තුල පිහිටා ඇති බදුකරුවන්ගේ දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය දේපල හිමියන්ගේ ඉල්ලීම මත විධිමත් අයදුම්පතක් ලබාගෙන කොට්ඨාශ භාර ආදායම් පරීක්ෂක නිලධාරීන්ගේ නිර්දේශ සහිතව තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් අයිතිය මාරු කිරීම මෙතෙක් සිදුකරන ලද ක්‍රියාවලිය වන බවත්,එම ක්‍රියාවලියේදී සිදුවන අඩුපාඩු නැවත සකස් කිරීම හා තොරතුරු ලබා ගැනීම වැනි කටයුතු වලදී සිදුවන කල්පමාවීම, තොරතුරු අස්ථානගත වීම වැනි කරුණු හේතුවෙන් නියමිත කාර්යය සිදුකරගැනීමට නොහැකිවන අවස්ථා පවතින බවත් දන්වා සිටිනවා.එම කරුණු සැලකිල්ලට ගෙන තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය අදාල පළාත් පාලන ආයතනයෙන් සකස් කල විධිමත් කමිටු ක්‍රියාවලියක් තුලින් සිදුකිරීම සුදුසු බව 2021.10.25 දින හා විවිධ/වරිපනම්/2021 අංක දරණ ලිපියෙන් දැනුම් දී ඇති බවත් දක්වා තිබෙනවා.ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට හැකි විධිමත් කමිටුවක් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙස අදාල ලිපිය මගින් ඉල්ලා තිබෙනවා.තක්සේරු දෙපාර්තමේන්තුවෙන් යොමුකල ලිපියේ පිටපතක් ද මේ සමඟ ඉදිරිපත් කර තිබෙනවා.පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට හැකි විධිමත් කමිටුවක් පත් කිරීමට අවශ්‍ය **යෝජනා ස්ථිර කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.**

__ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා - (එ.ජ.නි.ස.)__

පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට පහත සඳහන් කමිටුව පත් කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

| | |
|---|---|
| ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - කමිටු සභාපති |
| ආදායම් ප්‍රවර්ධන නිලධාරී, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - කමිටු සාමාජික |
| කාර්මික නිලධාරී, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - කමිටු සාමාජික |
| ආදායම් පරීක්ෂක, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - කමිටු සාමාජික |
| විෂය භාර නිලධාරී, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | - කමිටු සාමාජික |

__ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)__

එම යෝජනාව මා ස්ථිර කරනවා.

__ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා__

පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට ඉහත සඳහන් කමිටුව පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපල අයිතිය මාරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමට ඉහත සඳහන් කමිටුව පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## V.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව.

__ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා__

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමැතිය සඳහා ගරු සභාව වෙත ඉදිරිපත් වී තිබෙනවා.එම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමටත්,ඒ සඳහා භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට කමිටුවක් හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට කමිටුවක් පත් කිරීමටත් යෝජනා ස්ථිර කරන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයට දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්, භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට පහත අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමත්,

**<u>භාණ්ඩ තක්සේරු කිරීමේ කමිටුව.</u>**

**01. එස්.ඒ.චන්ද්‍රකුමාර මයා,විමර්ශන නිලධාරී,පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**02.එච්.ඒ.එම්.අරුණ නිලන්ත මයා, සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන)**

**03. ඊ.එම්.ටී.එස්.ඒකනායක මයා,කාර්මික නිලධාරී - කමිටු සාමාජික**

වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට පහත අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමත් සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ හා භාණ්ඩ වෙන්දේසි කිරීමේ කමිටුව</u>**

**01.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා**

**02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා**

**03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා**

**04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා**

**05.එච්.ඒ.එම්.අරුණ නිලන්ත මයා, සංවර්ධන නිලධාරී (ආදායම් ප්‍රවර්ධන)**

**06.ඒ.එම්.පී.අයි.කුමාරි මිය,ප්‍රධාන කළමනාකරණ සහකාර**

**07. ඊ.එම්.ටී.එස්.ඒකනායක මයා, කාර්මික නිලධාරී**

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්,භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට හා,වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට ඉහත අයගෙන් සමන්විත කමිටු පත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමත්, භාණ්ඩ වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට හා,වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා භාණ්ඩ වෙන්දේසි කිරීමට ඉහත අයගෙන් සමන්විත කමිටු පත් කිරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා ප.ව.12.24 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ප.ව.12.24 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා - නැත**

**06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**I.2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය, කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**

2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.01.18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II.2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)</u>**

2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.01.28 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව**

**සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III.2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල.මු.කො.)**

2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**2022.01.12 දින පැවති ප්‍රසසම්පාදන කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

**I. 2022 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2235475.00 | 858710.00 | 1376441.92 | 42440.00 | 84010.00 | 2240152.30 | 6837229.22 |
| 2 | ගමන් වියදම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 28888.00 | 116154.82 | 123045.00 | 1593.00 | 1700.00 | 0.00 | 271380.82 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 0.00 | 0.00 | 20300.00 | 0.00 | 0.00 | 0.00 | 20300.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 5000.00 | 5000.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **2264363.00** | **974864.82** | **1519786.92** | **44033.00** | **85710.00** | **2245152.30** | **7133910.04** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **2264363.00** | **974864.82** | **1519786.92** | **44033.00** | **85710.00** | **2245152.30** | **7133910.04** |
| | තැන්පත් | 1043995.19 | | | | | | 1043995.19 |
| | වැටි | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 164308.24 | | | | | | 164308.24 |
| | සේවක ණය | 132000.00 | | | | | | 132000.00 |
| | අත්තිකාරම් | 5000.00 | | | | | | 5000.00 |
| | ණයහිමි | 4133365.98 | | | | | | 4133365.98 |
| | සමුච්චිත අරමුදල | 745.20 | | | | | | 745.20 |
| | ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **5479414.61** | | | | | | **12613324.65** |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## II. 2022 ජනවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 933638.16 | 520200.00 | - | - | - | 37875.00 | 1491713.16 |
| 20 කුලී | - | - | 928065.51 | - | 852220.00 | 6000.00 | 1786285.51 |
| 30 බලපත්‍ර ගාස්තු | 103.00 | 289133.15 | - | - | - | 0.00 | 289236.15 |
| 40 සේවා සඳහා ගාස්තු | 1500.00 | 442823.00 | 915655.50 | 43597.00 | - | 3300.00 | 1406875.50 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 5145.00 | 0.00 | 0.00 | 0.00 | 5145.00 |
| 60 වෙනත් ආදායම් | 8800.00 | 55875.00 | 198988.01 | 72775.00 | 0.00 | 0.00 | 336438.01 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **944041.16** | **1308031.15** | **2047854.02** | **116372.00** | **852220.00** | **47175.00** | **5315693.33** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 1313484.96 | 0.00 | 0.00 | 0.00 | 1313484.96 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **944041.16** | **1308031.15** | **3361338.98** | **116372.00** | **852220.00** | **47175.00** | **6629178.29** |
| තැන්පත් | 524936.45 | | | | | | 524936.45 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 41911.00 | | | | | | 41911.00 |
| සේවක ණය | 0.00 | | | | | | 0.00 |
| අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| ණය ගැති | 10098468.41 | | | | | | 10098468.41 |
| සමු: අරමුදල | 1683.60 | | | | | | 1683.60 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 5000.00 | | | | | | 5000.00 |
| **මුළු එකතුව** | **10671999.46** | | | | | | **17301177.75** |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජනවාරි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2022 ජනවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6) | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 927865.13 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 832.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 3 | කඩ කුලී 3/22 | 312371.62 | 34069.15 | 696350.00 | 1008721.62 | 699216.13 | 26165.92 | 7903.23 | 38630.40 | 80801.62 | 321969.97 | 46533.63 |
| 4 | වත්කම් බදු 5/23 | 4360094.33 | 0.00 | 1242526.00 | 5602620.33 | 3579581.60 | 0.00 | 0.00 | 18610.00 | 3434821.60 | 2041648.73 | 18610.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 703877.80 | 70720.38 | 517438.00 | 1221315.80 | 58894.00 | 15995.45 | 54724.93 | 9977.00 | 172314.65 | 984088.70 | 64701.93 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 514200.00 | 514200.00 | 514200.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 6000.00 | 6000.00 | 6000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 289133.15 | 289133.15 | 289133.15 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 5376343.75 | 104789.53 | 3265647.15 | 8641990.90 | 6075722.01 | 42161.37 | 62628.16 | 67217.40 | 3687937.87 | 3347707.40 | 129845.56 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**
2022 ජනවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**
2022 ජනවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජනවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජනවාරි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. 2022 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 ජනවාරි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 325000 | 123000 | 448000 | 0 | 927865.13 | 927865.13 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 10000 | 6000 | 16000 | 0 | 832 | 832 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 200 | 50 | 250 | 0 | 0 | 0 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 30000 | 20000 | 50000 | 0 | 6000 | 6000 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 750 | 250 | 1000 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 1500000 | 500000 | 2000000 | 0 | 514200 | 514200 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 950000 | 410000 | 1360000 | 0 | 289133.15 | 289133.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 1391800 | 695900 | 2087700 | 0 | 699216.13 | 699216.13 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 198000 | 99000 | 297000 | 0 | 262200 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 55000 | 30000 | 85000 | 0 | 7200 | 7200 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 966000 | 483000 | 1449000 | 0 | 231208.65 | 231208.65 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 1444000 | 950000 | 2394000 | 0 | 707460 | 707460 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 821455 | 821455 | 1642910 | 0 | 3579581.6 | 3579581.6 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 55000 | 27500 | 82500 | 0 | 37875 | 37875 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 22000 | 12500 | 34500 | 0 | 0 | 0 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 7769205 | 4178655 | 11947860 | 0 | 7262771.66 | 7262771.66 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 05

| අනුඅංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 7772511.00 | 7772511.00 | 15545022.00 | 7060000.00 | 6837229.22 | 13897229.22 | 1647792.78 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 65000.00 | 85000.00 | 150000.00 | 50000.00 | | 50000.00 | 100000.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | | 12263000.00 | 400000.00 | 838000.00 | 1238000.00 | 375000.00 | 271380.82 | 646380.82 | 591619.18 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 1800000.00 | 1800000.00 | 3600000.00 | 1750000.00 | 20300.00 | 1770300.00 | 1829700.00 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | | 11474000.00 | 1000000.00 | 1000000.00 | 2000000.00 | 90000.00 | 5000.00 | 95000.00 | 1905000.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 8000.00 | 2784.73 | 10784.73 | 8000.00 | 2500.00 | 10500.00 | 284.73 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 280000.00 | 200000.00 | 480000.00 | 275000.00 | 150000.00 | 425000.00 | 55000.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 65000.00 | 123000.00 | 188000.00 | 60000.00 | 75000.00 | 135000.00 | 53000.00 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 3000000.00 | 3000000.00 | 6000000.00 | 150000.00 | 2000000.00 | 2150000.00 | 3850000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 38500.00 | 11095.83 | 49595.83 | 30000.00 | 10000.00 | 40000.00 | 9595.83 |
| | එකතුව | 176005532.00 | | 176005532.00 | 14429011.00 | 14832391.56 | 29261402.56 | 9848000.00 | 9371410.04 | 19219410.04 | 10041992.52 |

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)</u>**

2022 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 පෙබරවාරි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

## 08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)</u>**

අංක 3307 දරණ පිඹුරේ සඳහන් කට්ටි කරන ලද (සුනිල් ලෑන්ඩ් වත්ත) ලොට් අංක 13 දරණ අඩි 20 ක මාර්ගය පොදු මාර්ගයක් ලෙස භාවිතයට ඉඩ සලසා දෙන මෙන් ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව වාර්තාවේ තිබෙනවා.ඒ සම්බන්ධව දැන ගන්න අවශ්‍යයි.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා අපි ඒ සඳහා දිනයක් දා ගමු.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)</u>**

ගරු සභාපතිතුමා,ඒ සම්බන්ධව එදාම සවස මම හා තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ ස්ථානයට ගියා.ගිහින් පරීක්ෂා කලා.මම හිතන්නේ ඔබතුමා මේ පිළිබඳව දැනුවත් වෙලා නෑ.යම් යම් කාරණා සම්බන්ධව පමණයි ඔබතුමා දැනුවත් වී තිබෙන්නේ.මේකට කමිටු පත් කරන්න අවශ්‍යතාවකුත් නෑ,කල් ගන්න අවශ්‍යතාවයකුත් නෑ.මම ඔබතුමාට මේ මහා සභාවට සභාගත කරනවා මෙන්න මේ ලිපිය.මේකේ තිබෙනවා අවශ්‍ය සියලු දේවල්.මේකේ තීන්දු ගන්න ලේකම්තුමා උපදෙස් දී තිබෙනවා.2017 වර්ෂයේ අවසන් තීරණයක් දීලා ඉවරයි.ස්ථානීය පරීක්ෂාවක් සිදු කරන්න අවශ්‍ය නෑ.ඒ තිබෙන දේවල් ඉවත් කලේ නැතිනම් මේ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යොදලා ඒවා ඉවත් කරලා වියදම් වන මුදල අදාල පුද්ගලයාගෙන් අය කර ගන්නවා කියලා මෙම ලිපියේ සඳහන් වෙනවා.ගරු සභාපතිතුමා,ඒ අනුව කටයුතු කරන්න.

- ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා ප.ව.12.31 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ස්ථානීය පරීක්ෂාවක් කරන්න අවශ්‍ය නැතිනම් මේ සභාවේ තීන්දුවක් ගන්න.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

ගරු සභාපතිතුමණි,මේක පසුගිය මහා සභාවේ කතා කල යෝජනාවක්.සාමාන්‍යයෙන් මහා සභාවට ආව යෝජනාවක් මාස 06 ක් ගත වන තුරු නැවත සභාවට ඉදිරිපත් කරන්න බෑ.එතනත් ඔබතුමා කරන්නේ වරදක්.වෙනත් කරුණු යටතේ කලින් ඉල්ලීමක් නොකල යෝජනාවක්. ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා ලිඛිතව ඉල්ලීමක් කලා එතුමාට අවස්ථාව ලබා දෙන්න කියලා.ඔබතුමා මේකට අවස්ථාව ලබා දෙනවා නම් ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා ඉල්ලපු ඉල්ලීමටත් අවස්ථාව ලබා දෙන්න.ඔබතුමාගේ මේ ක්‍රියාකලාපයට අප්‍රසාදය පල කරනවා.අවස්ථාව ලබා නොදුන් නිසයි එතුමා මහා සභාවෙන් එළියට ගියේ.ඒ වගේම ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා පුද්ගලික අරමුණක් වෙනුවෙන් වත් සභාවට අපකීර්තියක් සිදු කරන්න වත් නෙවෙයි උපවාස කලේ.සමස්ත මන්ත්‍රී මණ්ඩලයට සිදුවන අසාධාරණය වෙනුවෙන් තමයි එතුමා උපවාස කලේ.අපේ පක්ෂයේ නායකයින්ගේ අවධානය යොමු කරවලා පක්ෂයේ විනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සහ පක්ෂයේ අනන්‍යතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි එතුමා උපවාස කලේ.ඒ සම්බන්ධව ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

ගරු සභාපතිතුමා,ජයන්ත හේරත් ගරු මන්ත්‍රීතුමා ලිපියක් ඉදිරිපත් කලේ එතුමාගේ නම සඳහන් කරලා මන්ත්‍රීවරු යම් ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධවයි.ඒක නිවැරදි කරන්නයි එතුමා කතා කලේ.ඔබතුමා අවස්ථාව දෙන්න බෑ කීව නිසයි එතුමා ගියේ.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීවරුණි,මේකේ අවශ්‍ය කටයුතු සෑහෙන දුරට සිදු වෙලා තිබෙන්නේ.දැන් ඔබතුමන්ලා මේක සභාවේ යෝජනා ස්ථිර කරන්න ඒවා ගලවලා ඉවත් කරන්න කියලා.මේ ප්‍රශ්නය විසඳ ගන්නයි අපිට ඕන.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමා ලිඛිතව තිබෙනවා නම් ඒ අනුව කටයුතු කරන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා - (එ.ජා.ප.)**

ගරු සභාපතිතුමණි,මෙම කාරණය සම්බන්ධව ලිපි ලේඛන අනුව කටයුතු කරන ලෙස මම යෝජනා කරනවා.එහි තිබෙන ගස් හා ගොඩනැගිලි ඉවත් කරලා මෙය මාර්ගයක් ලෙසම ලබා දෙන ලෙස මම යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා - (එ.ජා.ප.)**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා - (එ.ජ.නි.ස.)**

මෙතන මහජන නියෝජිතයෝ විදිහට අපි නියෝජනය කරන්නේ මහජනතාවයි.එහෙනම් අපි සැම දෙනාම තීන්දු ගන්න ඕන කාටවත් අසාධාරණයක් නොවෙන ආකාරයටයි.අපි කියන්නේ ස්ථානීය පරීක්ෂාවක් කරන්න සියලු මන්ත්‍රීවරු යමු කියලා.එතකොට අපිට තීරණයක් ගන්න පුළුවන්.ඒ නිසා අපි ඔය යෝජනාවට විරුද්ධයි.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගස් ගලවන්න නෙවෙයි අපි අනවසර ඉදිකිරීම් ඉවත් කරමු.මේ තීන්දුව 2017 වර්ෂයේ ගත්ත තීන්දුවක්.ඒ නියෝගය ක්‍රියාත්මක වෙලා නෑ.ඒ නියෝගය නැවත ක්‍රියාත්මක කිරීමට ඒ සඳහා යෝජනා ස්ථිර කරන්න.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,මේ සඳහා නිලධාරීන් යොදවලා පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීම සුදුසුයි කියලා තමයි මම නම් හිතන්නේ.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

ගරු සභාපතිතුමණි,මේ සියලු දෙනා සමඟම ගිහින් ස්ථානීය පරීක්ෂාවක් කලා නම් හොඳයි කියලා මම හිතනවා.

**ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා**

අපි මේක ගිහින් බලලා කාටවත් අසාධාරණයක් නොවන ආකාරයට සාධාරණ තීන්දුවක් ගමු.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

ගරු මන්ත්‍රීවරුණි,මී ළඟට පැවැත්වෙන මුදල් කමිටුව පවත්වන දිනයේ එම මුදල් කමිටුව අවසන් වෙලා අපි සියලු දෙනාම ගිහින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කරලා මේ සම්බන්ධව තීන්දුවක් ගමු.

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ පෙබරවාරි මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.ප.ව.12.55 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :පී.ඒ.ඩී.එස්.දිසානායක,කළමනාකරණ සේවා නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.